**කුරුවිට ප්‍රාදේශීය සභාව - 2023**

**-------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

කුරුවිට ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් පිළිබඳ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට කුරුවිට ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව

විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක  සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව  විගණනයේ කොටසක් ලෙස මා විසින්  විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන  ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

### 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කුරුවිට සම්මන්ත්‍රණ ශාලාව ඉදිකිරීමට ගෙවූ රු.3,972,698ක් ඉඩම් ගොඩනැගිලි ගිණුම බැර කර තිබුණි. | ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී නිවැරදි කරමි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |
| (ආ) | කර්මාන්ත 04ක ඉදිකිරීම් පිරිවැය රු.9,432,969ක් දෙවරක් ප්‍රාග්ධනිත කර තිබුණි. | - එම - | - එම - |
| (ඇ) | ඉදිකිරීම් 02ක පිරිවැය රු.28,016,924ක් වැඩියෙන් ප්‍රාග්ධනිත කර තිබුණි. | - එම - | - එම - |
| (ඈ) | එකතුව රු.22,671,941ක් වූ ගොඩනැගිලි 03ක්, ඉඩමක් හා ලී බඩු ප්‍රාග්ධනිත කර නොතිබුණි. | - එම - | - එම - |
| (ඉ) | බැංකු ජංගම ගිණුම් 02ක 2023 දෙසැම්බර් 31 දිනට වූ රු.5,292,338ක ශේෂ, මූල්‍ය ප්‍රකාශනවල නොපෙන්වා බැංකු සැසඳුම් ප්‍රකාශයට මාර්ගස්ථ මුදල් ලෙස ගැලපුම් කර තිබුණි. | - එම - | - එම - |
| (ඊ) | මුද්දර ගාස්තු මුදල් පදනම මත ගිණුම් තැබීම ගිණුම්කරණ ප්‍රතිපත්තිය වුවත්, 2021 වර්ෂයේ ලද රු.9,568,563ක මුද්දර ගාස්තු 2023 වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | - එම - | - එම - |
| (උ) | වියදම් ණයහිමියන් රු.3,905,484ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | - එම - | - එම - |
| (ඌ) | එකතුව රු.407,590ක් වූ 2023 දෙසැම්බර් 31 දිනට ලිපිද්‍රව්‍ය හා වීථි ලාම්පු අවසාන තොගය ගිණුම්ගත කර නොතිබුණි. | - එම - | - එම - |
| (එ) | වර්ෂය තුළ ලද රු200,000ක ඖෂධ තොගයක් හා 2022 වර්ෂයේ ආයුර්වේද ආධාර ලැබීම් රු.103,334ක් ලැබිය යුතු විෂයයන් ලෙස ගිණුම්ගත කර තිබුණි. | ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී නිවැරදි කරමි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |
| (ඒ) | හිඟහිටි කාමර කුළී රු.496,000ක් ලැබිය යුතු ලෙස ගිණුම්ගත කර නොතිබුණු අතර ඉදිරියට ලද වරිපනම් ගාස්තු රු.400,523ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | - එම - | - එම - |

| | | | |
|---|---|---|---|
| (ඕ) | ගිණුම් විෂයයන් 07ක මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂ හා උපයෝගී ලේඛන අනුව ශේෂ අතර රු.21,967,998ක වෙනසක් විය. | නිවැරදි කර ගැනීමට කටයුතු කරමි. | නොසැසඳීම් නිරවුල් කළ යුතු වේ. |

**1.6.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| එකතුව රු.343,070,438ක් වූ ගිණුම් විෂයයන් 09ක විස්තරාත්මක උපලේඛන හා කාල විශ්ලේෂණ ඉදිරිපත් නොවුණි. | තොරතුරු ලබා ගෙන උපලේඛන සකස් කිරීමටත් ලේඛන යාවත්කාලීන කිරීමටත් කටයුතු කරමි. | ගනුදෙනු නිසි පරිදි සටහන් කළ යුතු වේ. |

**1.7 අනුකූල නොවීම**

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මුදල් රෙගුලාසි 371 (5) අනුව, 2009 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා අවස්ථා 27ක දී නිකුත් කළ අත්තිකාරම් රු.2,597,900ක් මේ දක්වාම පියවා නොතිබුණි. | පරීක්ෂණ මණ්ඩලය ලබා දුන් නිර්දේශ අනුව අත්තිකාරම් පියවීමේ කටයුතු සිදු කරමින් පවතී. | එම මුදල් කඩිනමින් පියවාගත යුතු වේ. |
| (ආ) | ආයතන සංග්‍රහයේ XIV වැනි පරිච්ඡේදයේ 12.3 වගන්තියට පටහැනිව, සභාවේ ලේකම් විසින් පරිවර්තිත දීමනාව ලබා ගනිමින් රාජකාරී සඳහා රජයේ වාහන ද භාවිතා කර තිබුණි. | පරිවර්තිත ගමන් වියදම් ලබාගෙන තිබුණද, ස්ථිර ප්‍රවාහන දීමනාවක් ලබාගෙන නොමැත. ඒ අනුව මාණ්ඩලික නිලධාරියෙකු වශයෙන් රජයේ වාහන භාවිතා කර ඇත. | ආයතන සංග්‍රහය අනුව කටයුතු කළ යුතු වේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.57,657,816ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.63,358,707ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 8,039,737 | 9,315,237 | 9,186,695 | 10,520,615 | 7,428,955 | 8,418,956 | 5,930,941 | 11,262,318 |
| කුලී | 9,620,290 | 9,824,503 | 10,004,605 | 1,604,925 | 9,096,117 | 9,004,731 | 8,184,746 | 1,905,021 |
| බලපත්‍ර ගාස්තු | 2,311,800 | 3,150,854 | 3,150,854 | - | 2,204,250 | 2,780,474 | 2,780,474 | - |
| වෙනත් ආදායම් | 3,500,000 | 9,386,486 | 6,052,682 | 2,752,573 | 11,288,780 | 17,431,240 | 14,210,857 | 236,468 |
| | 23,471,827 | 31,677,080 | 28,394,836 | 14,878,113 | 30,018,102 | 37,635,401 | 31,107,018 | 13,403,807 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වසර 05ට වඩා පැරණි හිඟහිටි වරිපනම් රු.2,883,436ක් හා වසර 03කට වඩා පැරණි හිඟහිටි අක්කර බදු රු.729,261ක් අය වීමට පැවැතිණි. | හිඟ ආදායම් අයකර ගැනීමට ඉදිරියේදී කටයුතු කරමි. | හිඟ ආදායම් රැස් කළ යුතු වේ. |
| (ආ) | කර්මාන්ත බදු, ව්‍යාපාර බදු හා වෙළඳ බලපත්‍ර ගාස්තු අයකළ යුතු ආයතන පිළිබඳ සමීක්ෂණයක් කර නොතිබුණි. | 2024 වර්ෂය වෙනුවෙන් සමීක්ෂණ කටයුතු සිදු කරමින් පවතී. | ආදායම් රැස් කළ යුතු වේ. |
| (ඇ) | එක්වන් මුදල් රු.626,450ක් ගෙවීමට, ගිවිසුම්ගතවීමට හා හිඟහිටි බදු කුලී රු.101,200ක් ගෙවීමට කටයුතු නොකළ කඩ කාමරයක් සහ රු.200,000ක එක්වන් මුදලක් නොගෙවූ කඩ කාමරයක් පවරා ගෙන නොතිබුණි. | ගිවිසුම් ගතවී නොමැති කඩ කාමරය නැවත ටෙන්ඩර් කිරීමට කටයුතු කර ඇත. අදාළ වාර්තාව ලද පසු ඒ අනුව කටයුතු කරමි. | හිඟ මුදල් අය කිරීමත්, කඩ කාමරය පවරාගැනීමත් කළයුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | කිරිඇල්ල පෙර පාසැලක සියලු නඩත්තු හා පරිපාලන කටයුතු සභා අරමුදලින් දරනු ලැබුවද, ළමුන්ගෙන් අය කරන මාසික ගාස්තු රු.44,800ක් සභා අරමුදලට බැර නොකර පෙර පාසලේ ගුරුවරියන් විසින් ලබාගෙන තිබුණි. | වැටුප් නොලබන පාලිකාවන්ට දෙමාපියන් විසින් වැටුප් ගෙවා ඇත. 2023 අගෝස්තු සිට දෙමාපින්ගෙන් මුදල් එකතු නොකෙරේ. | පළාත් පාලන කොමසාරිස්ගේ උපදෙස් අනුව කටයුතු කළ යුතු වේ. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | නාමල්දෙණිය සංචාරක ගිමන්හල වසංගත තත්ත්වය මත විවෘත නොකළ නිසා 2021 අප්‍රේල් සිට 2022 ඔක්තෝබර් දක්වා ගෙවූ බදු රු.813,960ක් නිදහස් කරන ලෙස බදුකරුගේ ඉල්ලීමට මේ දක්වා ආණ්ඩුකාර අනුමැතිය ලබා ගෙන නොතිබුණි. පසුව, ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් ද බැහැරව 2022 අප්‍රේල් සිට වර්ෂයකට එම බදුකරු වෙත ගිමන්හල බදු දී තිබුණි. | එම කාලය තුළ ගිමන් හල සත්‍ය වශයෙන් විවෘත කර නොතිබුණේද යන්න සඳහා තොරතුරු කැඳවා ඇත. | ආදායම් රැස්කළ යුතු වේ. ආදායම් කපා හැරීම විධිමත් අනුමැතීන් මත පමණක් සිදුකළ යුතු වේ. |
| (ආ) | ප්‍රදර්ශිත දැන්වීම් පුවරු පිළිබඳ සමීක්ෂණයක් 2023වර්ෂය තුළ සිදුකර නොතිබුණි. | එවැනි සමීක්ෂණයක් සිදු කර නොමැත. | ආදායම් රැස් කළ යුතු වේ. |
| (ඇ) | පර්චස් 609ක් වූ ඉඩම්වල ආරක්ෂාවට ප්‍රමාණවත් පියවර ගෙන නොතිබුණි. ඉන් එක් ඉඩමක වගා කිරීමත්, තවත් ඉඩමක පෙර පාසැලක් පැවැත්වීමටත් අනවසරකරුවන් කටයුතු කර තිබුණි. | නිරීක්ෂණය පිළිගනිමි. ඉදිරියේදී කරුණු විමසා බලා කටයුතු කරමි. | වත්කම් ආරක්ෂා කරගත යුතු වේ. |

**3.2 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වෙළඳ සංකීර්ණයේ වූ සම්මන්ත්‍රණ ශාලාව ඉදිකිරීමේදී රු.3,188,688ක් වැඩිපුර ගෙවා තිබුණි. එය රු.34,793,520ක් වැයකර 2022 වර්ෂයේ නිමකර තිබුණ ද, මූලික අවශ්‍යතා අසම්පූර්ණ වීම නිසා 2023 දෙසැම්බර් වන විටත් නිෂ්කාර්යයව පැවැතිණි. | ප්‍රමාණවත් පිළිතුරු ලබා දී නොතිබුණි. | වැඩිපුර ගෙවීම් අයකර ගත යුතු අතර වත්කම් අභාවිතව නොතැබිය යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ආ) | මාර්ග 33ක අලුත්වැඩියා සඳහා රු.1,912,932ක් ගෙවා තිබුණ ද, නියැදි පරීක්ෂාවට අනුව මාර්ග 07ක එම කාර්යය ඉටුකර නොතිබුණි. එමෙන්ම, එම මාර්ග ඇතුළු තවත් ඉදි කිරීම් 03ක් වෙනුවෙන් රු.299,974ක් වැඩිපුර ගෙවා තිබුණි. | වැඩිපුර ගෙවීම්වලින් රු.402,414ක් අයකර ඇති අතර ඉතිරිය අයකර ගනු ලැබේ. | වැඩිපුර ගෙවීම් අයකළ යුතු වේ. |
| (ඇ) | මාර්ග 33ක අලුත්වැඩියාවල දී ගල් ප්‍රවාහනයට ගෙවූ රු.759,560ක නිවැරදිතාව තහවුරු කරගත නොහැකි විය. | කොරෝනා වසංගතය නිසා ඉතා දුර බැහැර සිට ගල් ප්‍රවාහනය කිරීමට සිදු විය. | ප්‍රවාහන දුර සහ බිල්පත් තිබිය යුතු වේ. |

**3.3 වාහන උපයෝජනය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගලි බවුසරය 2022 වර්ෂයේදී රු.784,110ක් ගෙවා අලුත්වැඩියා කර තිබුණ ද, 2023 මැයි වන විටත් නිෂ්කාර්යයව පැවැතිණි. | ගලි බැහැරලීමට ස්ථානයක් නොමැති නිසා ගලි සේවාව ලබා දීමට නොහැකි වී ඇත. එය ජලය ප්‍රවාහනයට භාවිතා කර ඇත. | වත්කම් ඵලදායී ලෙස උපයෝජනය කළ යුතු වේ. |